සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය 2018<br>**இரண்டாம் தவணைப் பரீட்சை 2018**<br>Second Term Test 2018 | 7 ශ්‍රේණිය<br>**தரமடு 7**<br>Grade 7 |
| සිංහල භාෂාව හා සාහිත්‍යය 1-11<br>Sinhala Language And Literature 1-11 | පැය දෙකයි<br>**இரண்டு மணித்தியாலம்**<br>Two Hour |

1 කොටස

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

- පහත වැකිවල ඇති රූඩීවලට යටින් ඉරක් අඳින්න

1 සොරු පැමිණීමෙන් ඔහුගේ මුළු සේසතම අහිමි විය.

2 පන්ති නායකයා මගේ ගජ මිතුරෙකි.

- නොගැලපෙන වචනය යටින් ඉරක් අඳින්න

3 අහස -(ගගන, නුඹ, පවන, අඹර)

4 මුහුණ-(වත, සිසි, මුව, වුවන)

- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනයට යටින් ඉරක් අඳින්නග

5 ශිෂ්‍ඨාචාරය, ශශ්ටාචාරය, ශිෂ්ටාචාරය, සිෂ්ටාචාරය

6. නිෂ්පාදන, නිස්පාදන , නිශ්පාදන, නිස්පාධන

- පහත සඳහන් පදවලට අදාළ අනුක්ත පද ලියන්න

7 i ළමයෙක්............................ ii මිනිස්සු..........................

8. පහත සඳහන් වගන්තියේ ඇති උපසර්ග පද 2 ක් යටින් ඉරක් අඳින්න.

එස් මහින්ද හිමියන් විසින් රචනා කරන ලද ජාත්ක අනුරාගය දනවන කවි කියවීමෙන් ජාතික අභිමානය
පිළිබඳ අනුවේදනීය හැඟීම් පිබිදෙයි

9. සිංහල භාෂාවේ මහප්‍රාණ අක්ෂර යෙදුණු වචන 2 ක් ලියන්න

i. .................................... ii ..................................

10. පහත වචනවල අර්ථ ලියන්න.

i. තුලදර................................ ii පිපෙට්ටි .............................

11. පහත සඳහන් පදවලට අදාළ ස්ත්‍රී ලිංග පද ලියන්න

i. වලසා........................... ii සභාපති.................................
iii හංසයා................................ iv මොනරා.................................

12. පහත සඳහන් වැකිවලට අදාල තනි පද (ඡත්‍රපද) ලියන්න

i. යමෙකුගේ හෝ යමක් සිහිපත් කිරීම ...........................................................................

ii කිසිවෙකුගේ පිහිටක් නැති .................................................................................

- පහත ඉරි ඇඳි පද කවර ක්‍රියා වර්ගයට අයත් දැය දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

13 දැරිය මල් නෙළා වට්ටියට ඇසුරුවා ය

i. විධි ක්‍රියා ii මිශ්‍ර ක්‍රියා
iii පූර්ව ක්‍රියා iv පූර්ව ක්‍රියා

14. නිළිය ගී ගය ගයා නටයි
i මිශ්‍ර ක්‍රියා ii විධි ක්‍රියා
iii පූර්ව ක්‍රියා iv පූර්ව ක්‍රියා

- සුදුසු ක්‍රියා පද යොදා හිස්තැන් පුරවන්න

15. අපි සෙල්ලම්............................( කරමි/කරමු)

16. ගොවියෝ කුඹුර............................( කෙටූහ/කෙටුවා ය)

17. නුඹ අකුරු ................................( ලිව්වෙහු/ලිව්වෙහි)

- පහත ප්‍රස්ථාව පිරුළු වල හිස් තැන් පුරවන්න

18 වඳින්න ගිය දේවාලෙ.............................

19 බීරි අලින්ට.....................................

- හිස් තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.

20. (අ) වේදිකාවට පැමිණි...........................ආරාධිත අමුත්තා
(ආ) දරුවන්ට ත්‍යාග.......................ය කළේ ය.

(ප්‍රදාන, ප්‍රධාන)

## 11 කොටස

- පළමු ප්‍රශ්නය දෙවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න

1. පන්ති කාමරය තුළ ඔබ විසින් සිදු කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න
   i සඟරාව සකස් කොට ඔබ යෙදූ නම, මාතෘකාව ලියන්න.
   ii ඔබ ඒ සඳහා ඉදිරිපත් කළ නිර්මාණ දෙකක් නම් කරන්න.
   iii මේ සඳහා ඔබට ගුරුතුමා හෝ ගුරුතුමියගෙන් ඔබට ලැබුණ උපදෙස් දෙකක් ලියන්න
   iv සඟරාව නිර්මාණය කිරීමෙන් ඔබ තුළ වර්ධනය වූ කුසලතා දෙකක් ලියන්න.

(ලකුණු 10යි)

2. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නො අඩු රචනාවක් ලියන්න.

   i. වන අසිරිය රැක ගනිමු
   ii ලෝකෙන් උතුම් රට ලංකාවයි
   iii පොදු දේපල සුරකිමු
   iv අති පූජ්‍ය වැලිවිට සරණංකර සංඝරාජ හිමි
   v නිමක් නැති වර්ෂාව ඇද හැලෙන්නට වූයේ පැය ගණනකට පෙරය අධික වර්ෂාව මධ්‍යයේ වුවද මහා මාර්ගයේ ගමන් ගත් වාහන වල අඩුවක් නැත.මම රැඳී සිටි දෙමහල් ගොඩනැගිල්ලේ පහත මාලය දෙසින් විශාල ශබ්දයක් ඇසුණේ මා රැඳී සිටි ස්ථානය සලිත කරමිනි

(ලකුණු 15යි)

3 ඔබ විද්‍යාලයේ සිසුන් පිරිසක් අධ්‍යාපන ප්‍රදර්ශනයක් නැරඹීමට යාම සඳහා බස් රථයක් අවශ්‍ය බව දන්වා සංවිධායක කමිටුවේ ලේකම් විසින් විදුහල්පතිතුමා මඟින් ඩිපෝ අධිකාරීතුමාට යවන රාජකාරී

ලිපියක් ලියන්න. කමිටුවේ ලේකම් ඔබ යැයි සිතන්න.

(ලකුණු 15යි)

4 පහත දැක්වෙන කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

ගහකොළ නිදි අතරේදී
ලොව නිහඬව තිබිය දී
රස ගීයක් අකුළා ගෙන
සිහිනවලට වැදි වැදී

i. මෙම පද්‍යය උපුටාගත් පාඩම කුමක් ද?
ii මෙම පද්‍යය රචනා කළේ කවුරුන්ද?
iii මෙම කවියෙන් විස්තර වන්නේ කුමන වේලාවක් ද?
iv මෙහි සඳහන් ක්‍රියා පදයක් ලියන්න .
v "රස" යන්නෙහි විරුද්ධ පදය ලියන්න.

5. පහත දැක්වෙන ප්‍රකාශය ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

"එසේ හෙයින් නික්මීම පිණිස කළ පාටවයට උත්තමගේ වෛර නොබඳිති'යි කියා කීහ"

i මෙම ප්‍රකාශය උපුටාගත් පාඩම නම් කරන්න.
ii මෙම ප්‍රකාශය කළේ කවු ද?
iii මෙහි "පාටවය" යනු කුමක් ද?
iv මෙම කතාව උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?
v මෙහි සඳහන් පුද්ගලයාට පාටව කිරීමට හේතුව කුමක්ද?

6 දුම්රිය නැවතුමක දී දුම්රියක් වේදිකාවක නතර කර ඇත. එහිදී ඔබට ඇසුණු නිවේදනයක් ලියන්න.

දෙවන වාර පරීක්ෂණය 2018

**සිංහල භාෂාව හා සාහිත්‍යය I පිළිතුරු 7 ශ්‍රේණිය**

1මුළු සේසතම

2 ගජ මිතුරෙකි

3පවන

4 සිසි

5 3

6 1

7 ළමයෙකු, මිනිසුන්

8 අනුරාගය, අභිමානය

9 සිසුන් ලියා ඇති නිවැරදි වචන දෙකට ලකුණු ලබා දෙන්න.

10 රන් කර්මාන්තයේ යෙදුන ශිල්පියා

11වැලහින්න, සභාපතිනි, හංස ධේනුව,සෙබඩ

12 අනුස්මරණය , අසරණ

13 iii

14 1

15 කරමු

16 කෙටූහ

17 ලිව්වෙහි

18 හිසේ කඩා වැටුණා වගේ

19 වීණා ගායනා කරනව වගේ

20 1 ප්‍රධාන 11 ප්‍රදාන

4. i සිහින කුමාරි
ii ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
iii රාත්‍රිය
iv වැදි වැදී, අකුළා , නිදි
v නීරස

5 i තිලමුට්ඨි ජාතකය
ii දිසාපාමොක් ඇදුරු
iii දඬුවම
iv පන්සිය පනස් ජාතකය
v තල හොරකම